# 2013 කාර්ය සාධන වාර්තාව හා ගිණුම්

# செயற்றிறன் அறிக்கையும் கணக்குகளும்

# PERFORMENCE REPORT & ACCOUNTS



## බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## மாவட்டச் செயலகம்

## *Badulla District Secretariat*

# බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වැය ශීර්ෂය - 276**

# 2013

**වර්ෂය සඳහා**

# කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම

## බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ පණිවුඩය

බදුල්ල දිස්ත්‍රික්කයේ 812,000 ක් පමණ වන ජනතාවගේ රාජ්‍ය මට්ටමේ විවිධ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ කාර්යයේ දී දිස්ත්‍රික්කයේ පරිපාලන කේන්ද්‍රස්ථානය වශයෙන් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාකරනු ලැබේ. විවිධ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 40 කට ආසන්න ප්‍රමාණයක භෞතික හා මුල්‍ය ඉලක්කයන් සපුරා ගැනීමට මෙම කාර්යාලය හා ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 විසින් ඉටු කරනු ලබන කාර්යය අතිමහත්ය.

කෘෂිකාර්මික ආර්ථිකයකින් හෙබි බහුතර ජනතාවක් සිටින දිස්ත්‍රික්කයක් වශයෙන් මෙහි ජන ජීවිතය නඟා සිටුවීම සඳහා සමාජ, ආර්ථික සාධකයන්ගේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම අරමුණු කරගෙන රාජ්‍ය මට්ටමේ සුවිශාල දායකත්වයක් 2013 වර්ෂය තුළදී ලබාදෙන ලදී. 2013 වර්ෂය තුළ රු. මිලියන 2,375 පමණ මුදලක් උපයෝජනය කරමින් මෙම කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සමාජ, ආර්ථික මට්ටම ඉහළ නැංවීමට රාජ්‍ය මට්ටමේ මැදිහත්වීම සිදුකර ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන, දිවිනැඟුම වැඩසටහන වැනි වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කරමින් නොමඳ සහායක් ලබා දීමට 2013 වර්ෂය තුළදී හැකිවුණි. එකී කාර්යය සාධනයන් මෙන්ම 2013 වර්ෂයේ මූල්‍ය තොරතුරු ද ඇතුළත් කරමින් මුදල් රෙගුලාසි 402 ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සැකසූ **'කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම් 2013'** යන මැයෙන් මෙම වාර්තා පොත ඉදිරිපත් කරමි.

රෝහණ කීර්ති දිසානායක
බදුල්ල දිස්ත්‍රික් ලේකම්

# පටුන

පිටු අංක


- හැදින්වීම 01
- දැක්ම, මෙහෙවර හා ප්‍රධාන ක්‍රියාකාරකම් 02-04
- දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා දත්ත 05-10
- පරිපාලන ව්‍යුහය 11-13
- කාර්යය මණ්ඩල විස්තරය හා සංවිධාන සටහන 14-15
- වාර්ෂික කාර්යසාධනය 16
  - පුනරාවර්තන හා මූලධන 17-19
  - වියදම් ප්‍රභවය 20
  - 2013 වර්ෂයේ ආදායම 21
  - පොදු තැන්පතු 22
  - රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම 23
  - වර්ෂයේ අග්‍රිම වාර්තාව 24
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අදාළව 2013 වර්ෂයේ ඉටුකළ කාර්යයන්
  - පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය 25-26
  - විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කිරිම 26-27
  - දිවිනැගුම 27-28
  - සමෘද්ධි වැඩසටහන, දිවිනැගුම 29-31
  - 2013 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්, වියදම් හා ඉතිරිය 32
  - ප්‍රධාන කාර්යයන් 33
- මහජන සේවා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරිම 34
- විසර්ජන ගිණුම 2013 35
- වැඩසටහන් අනුව විසර්ජන ගිණුම 2013 36
- ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් 37
- ව්‍යාපෘති අනුව මූලධන වියදම් 38
- වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ 39
- එක් එක් වැඩසටහනක ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය 40

# හැදින්වීම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි. එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 567 ක් ඇති අතර, එම ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුළ ගම් 1996 ක් හා දෙමළ ජනතාව ජීවත් වන වතු(වැවිලි) 186 ක් ඇත. ප්‍රාදේශීය සභා 14ක්, නගර සභා 01 ක් හා මහ නගර සභා 02 ක් මෙම දිස්ත්‍රික්කය තුළ දේශපාලන හා පරිපාලනය හා සම්බන්ධව පවතී.

දිස්ත්‍රික්කයේ පවුල් 227,428කට වැඩි සංඛ්‍යාවක් ඇති අතර, එම පවුල් වල මුළු ජනගහනය 811,758 ක් පමණ වේ.මෙම ජනගහනයෙන් 406,623 ක පිරිසක් සේවා නියුක්තව සිටින අතර, සේවා වියුක්තිකයන් සිටින සංඛ්‍යාව(ශ්‍රම බලකායට අයත්) 16,891 කි

බදුල්ල දිසත්‍රික්කයේ ජීවත් වන ජනතාවගෙන් වැඩි පිරිසකගේ ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි.එනිසා, අඩු ආදායම් ලබන පිරිස ඉහළ මට්ටමක පවතී. රජයේ සමෘද්ධි වැඩසටහන යටතේ ආධාර ලබන සංඛ්‍යාව 59,273 කට ආසන්න වේ.විශ්‍රාම වැටුප් ලබන පිරිස 17,399 කට ආසන්න වේ.

එනිසා මෙම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා රාජ්‍ය මට්ටමේ දායකත්වය ලබාදීමත්, එම ජනතාව අපේක්ෂා කරනු ලබන සේවාවන් නොපිරිහෙලා ඉටු කිරිමත්, සමෘද්ධි සහනාධාර ඇතුලු විවිධ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරිමත්, විශ්‍රාම වැටුප් ගෙවීමත්, ආබාධිතයින් හා අබාධ වලට ලක් වුවන්ට සහන සැලසීමත්, ජාතික වැදගත් කමක් ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ මැදිහත් කරුවන් ලෙස කටයුතු කිරීමත්, ඇතුළු විවිධ කාර්යන් රාශියක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටුකරනු ලැබේ.

එකී කාර්යයන් ඉටු කිරිමට සහයවිම සඳහා 2013 වර්ෂයට දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 533 ක ප්‍රතිපාදන මුදල් ලැබුණි. එයින් මිලියන 463 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, මිලියන 70 ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන්විය. එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 517 ක් උපයෝජනය කළ හැකි විය.උපයෝජනය කළ මුදල මුළු ප්‍රතිපාදන මුදලින් 97% ක් පමණ වේ. මෙයට අමතරව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වලට අදාළ කාර්යයන් රාශියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටුකරනු ලැබේ. 2013 වර්ෂය සඳහා එකී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එම කාර්යයන් සඳහා රු. මිලියන 2,523 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර දුනි. එම මුදලින් රු. මිලියන 2,375 ක් උපයෝජනය කළ හැකි වු අතර, එම මුදල මුළු ප්‍රතිපාදනයෙන් 94% ක් පමණ වේ. විවිධ හේතුන් නිසා එම ප්‍රතිපාදනයෙන් 06% ක මුදලක් උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.

ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගේ ජීවන තත්වය ඉහළ නංවාලමින්, ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරිම සඳහා රාජ්‍ය මට්ටමේ දායකත්වය නිසි ලෙස සපයමින් සිය කාර්යයන් ඉටු කිරිම මෙම කාර්යාලය හා මෙයට සම්බන්ධව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියා කරන ලදී. ඒ නිසා ප්‍රාදේශීය සංවර්ධනයේ රාජ්‍ය මට්ටමේ දායකත්වය 2013 වර්ෂයේද ඉහළ මට්ටමක පැවැතිනි.

# අපේ දැක්ම

"පුරවැසි සංතෘප්තිය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ප්‍රාදේශීය පරිපාලනය මෙහෙයවීමේ නියමුවා"

# මෙහෙවර

"දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව මනා සැලැස්මකින් යුතුව, සම්පත් හා ආයතන ඵලදායී ලෙස මෙහෙය වන්නා වූ මනා සම්බන්ධීකරණයක් තුළින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම"

# ප්‍රධාන ක්‍රියාකාරකම්

1. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ අනුබද්ධ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම.

2. රජයේ සියලු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යමින් පැවරෙන කටයුතු ඉටු කිරීම.

3. රජය හා පළාත් සභාව විසින් පවරා ඇති කටයුතු වෙනුවෙන් ආදායම් එකතු කිරීම.

4. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා පරිපාලනය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම.

5. පළාත් සභාවට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

6. මැතිවරණ පැවැත්විමට අදාළ සියලු කටයුතු සිදු කිරීම.

7. විමධ්‍යගත අයවැය වැඩ සටහන ඇතුලුව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් පවරන ප්‍රතිපාදන යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

8. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ඇතුලු විවිධ විෂයන් සඳහා සම්බන්ධීකරණ රැස්විම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු පවත්වාගෙන යාම.


9. දිස්ත්‍රික්කයේ සියලු රාජ්‍ය, ආගමික, සංස්කෘතික ආදී උත්සව සංවිධානය කිරීම.


10. සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් ජනතාව හා රාජ්‍ය ආයතන කටයුතු අතර සම්බන්ධීකරණය සඳහා දායක වීම හා පොදු සමාජයීය කාරණා නිරාකරණය සඳහා මැදිහත්ව කටයුතු කිරීම.

# දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා දත්ත

## ජනගහනය

බදුල්ල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 811,758 කට ආසන්න වේ. එම ජනගහනයෙන් 48% ක් පිරිමින් වන අතර, 52% ක් කාන්තාවන් වෙති. අවුරුදු 14 ට අඩු ජනගහනය 224,802 කි.




මෙම දිස්ත්‍රික්කයේ ජීවත්වන පිරිසෙන් 50% ක් රැකියා නියුක්තව සිටින නමුත්, යැපෙන්නන්ගේ අනුපාතය ඉහළ අගයක් ගැනීම දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එම ප්‍රතිශතය 50% කට ආසන්න වේ.


### ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් භූමි ප්‍රමාණය හා ජනගහනය පිළිබඳ තොරතුරු

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාශ* | *භූමි ප්‍රමාණය ව. කි. මී* | *ජනගහනය* | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | *ගැහැණු* | *එකතුව* |
| මහියංගණය | 35 | 601 | 37,170 | 38,157 | 75327 |
| රිදිමාලියද්ද | 42 | 431 | 25,069 | 26,366 | 51435 |
| මීගහකිවුල | 20 | 105 | 9,461 | 10,079 | 19540 |
| කන්දකැටිය | 26 | 157 | 11,266 | 11,923 | 23189 |
| සොරණාතොට | 25 | 79 | 10,715 | 11,780 | 22495 |
| පස්සර | 41 | 136 | 22,939 | 25,637 | 48576 |
| ලුණුගල | 28 | 144 | 14,643 | 16,449 | 31092 |
| බදුල්ල | 29 | 51 | 35,085 | 39,666 | 74751 |
| හාලිඇල | 57 | 165 | 42,732 | 47,447 | 90179 |
| ඌවපරණගම | 68 | 138 | 38,101 | 40,798 | 78899 |
| වැලිමඩ | 64 | 188 | 48,862 | 51,572 | 100434 |
| බණ්ඩාරවෙල | 35 | 71 | 31,039 | 34,072 | 65111 |
| ඇල්ල | 32 | 111 | 21,785 | 22,978 | 44763 |
| හපුතලේ | 26 | 72 | 23,309 | 25,176 | 48485 |
| හල්දුම්මුල්ල | 39 | 412 | 18,140 | 19,342 | 37482 |
| **එකතුව** | **567** | **2,861** | **390,316** | **421,442** | **811,758** |

# සේවා නියුක්තිය

බදුල්ල දිස්ත්‍රික්කයේ මුළු ජනගහන යෙන් 51% ක් එනම් 439,085 ක් ශ්‍රම බලකායට ඇතුළත් වෙති. එම ශ්‍රම බලකායෙන් 406,623 ක් සේවා නියුක්තව සිටිති. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ සේවා නියුක්ත ප්‍රතිශතය 96% කි.මෙවැනි ඉහළ සේවා නියුක්තියක් දක්නට ලැබෙන්නේ මෙම දිස්ත්‍රික්කය තුළ ජීවත්වන අය බොහෝ දෙනෙක් කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තව සිටින බැවිනි. එය මුළු සේවා නියුක්තියෙන් 64% කි.


| අංශය | සේවා නියුක්තිය |
|---|---|
| කෘෂිකාර්මික | 256,330 |
| කාර්මික | 45,995 |
| සේවා | 104,298 |
| | 406,623 |




## දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණය පිළිබඳ තොරතුරු

මෙම දිස්ත්‍රික්කයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 286,100 කි. එයින් වී තේ ,රබර් ,පොල් හා වෙනත් බෝග වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 67,258 කි .එය මුළු ඉඩම් ප්‍රමාණයෙන් %34 කි.හේන් හා ගෙවතු වගා කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 67,745 කට ආසන්න වේ. ඒ අනුව වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 165,075 කට ආසන්න වේ.

| ඉඩම් ස්වභාවය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | ප්‍රතිශතය % |
|---|---|---|
| 1.අස්වද්දන ලද කුඹුරු | | |
| I. වාරිමාර්ග | 23792.0 | 8.3 |
| II. අහස් දියෙන් | 6365.0 | 2.2 |
| 2.තේ | 34042.0 | 11.9 |
| 3.රබර් | 412.0 | 0.1 |
| 4.පොල් | 3608.0 | 1.3 |
| 5.කුරුඳු | 428.0 | 0.1 |
| 6.වෙනත් වගාවන් | 28264.0 | 9.9 |
| 7.වනාන්තර | | |
| I. ඝන වනාන්තර | 47782.0 | 16.7 |
| II.විවෘත වනාන්තර | 26646.0 | 9.3 |
| III.වගා කරන ලද වනාන්තර | 7034.0 | 2.5 |
| 8.ලඳු කැලෑ හා හේන් | 43566.0 | 15.2 |
| 9.වගුරු | 165.0 | 0.1 |
| 10.ගෙවතු | 24152.0 | 8.4 |
| 11.ජලාශ | 6109.0 | 2.1 |
| 12.ගොඩනැගිලි | 823.0 | 0.3 |
| 13.වැලි හා ගල් පර | 4731.0 | 1.7 |
| 14.මුඩු බිම් හා අත්හරින ලද ඉඩම්(තෘණබිම් ද ඇතුළත්ව) | 28181.0 | 9.9 |
| එකතුව | 286100.0 | 100.0 |




# සෞඛ්‍ය හා අධ්‍යාපන තොරතුරු



| | | |
|---|---|---|
| මරණ අනුපාතය | (ජනගහනයෙන් දහසකට) | 5.2 |
| උපත් අනුපාතය | (ජනගහනයෙන් දහසකට) | 20.9 |
| ළදරු මරණ අනුපාතය | (සජීවි උපත් දහසකට-වර්ෂය 2003) | 9.9 |
| මාතෘ මරණ අනුපාතය | (සජීවි උපත් දහසකට) | 27.5 |

| *රොහල්/වෛද්‍ය ආයතන* | *ගණන* | *සේවකයින් ගණන* |
|---|---|---|
| පළාත් මහා රොහල් | 01 | 1475 |
| මූලික රොහල් | 03 | 615 |
| ප්‍රාදේශීය රොහල් | 31 | 1238 |
| වතු රොහල් | 13 | 104 |




| | |
|---|---|
| *පාසල් සංඛ්‍යාව* | *574* |
| *ගුරුවරු සංඛ්‍යාව* | *12,368* |
| *ශිෂ්‍යයින් සංඛ්‍යාව* | *182,211* |
| *ගුරු ශිෂ්‍ය අනුපාතය* | *15* |

# දරිද්‍රතාවය

## බදුල්ල දිස්ත්‍රික්කයේ

මෙරට දිස්ත්‍රික්ක අතුරින් ඉහළ දරිද්‍රතාවයක් පෙන්නුම් කරන දිස්ත්‍රික්කයක් වශයෙන් බදුල්ල දිස්ත්‍රික්කය හඳුන්වා දිය හැකිය. යැපෙන්නන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පැවතීමත්, ඒක පුද්ගල ආදායම පහළ මට්ටමක පැවතීමත් ඊට බලපා ඇත. කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වන නමුත්, මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට තරම්වත් ප්‍රමාණවත් ආදායමක් නොලබන සැලකිය යුතු ජනගහනයක් මෙම දිස්ත්‍රික්කයේ ජීවත් වෙති.




2002 වර්ෂයේ කරන ලද සමීක්ෂණයට අනුව, බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය.

| | දරිද්‍රතා සීමාවට පහළ ජනගහනය මුළු ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස | දරිද්‍රතා සීමාවට පහළ කුටුම්බ ජනගහනය |
|---|---|---|
| ශ්‍රී ලංකාව | **22.7** | **3,206,800** |
| බදුල්ල දිස්ත්‍රික්කය | **37** | **241,697** |
| මහියංගණය | 38.57 | 24,989 |
| රිදිමාලියද්ද | 51.15 | 22,891 |
| මීගහකිවුල | 46.5 | 8,478 |
| කන්දකැටිය | 46.1 | 10,183 |
| සොරණාතොට | 34.24 | 7,533 |
| පස්සර | 34.88 | 15,395 |
| ලුණුගල | 38.82 | 12,616 |
| බදුල්ල | 17.19 | 11,205 |
| හාලිඇල | 34.58 | 29,672 |
| ඌවපරණගම | 33.35 | 25,054 |
| වැලිමඩ | 29.19 | 26,698 |
| බණ්ඩාරවෙල | 21.61 | 12,363 |
| ඇල්ල | 28.04 | 11,665 |
| හපුතලේ | 24.42 | 11,241 |


මෙම සංඛ්‍යා තොරතුරු අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 37% ක් 2002 වර්ෂයේදි දරිද්‍රතාවයෙන් පෙළුණි. දරිද්‍රතාවයෙන් පෙළෙන මුළු ජනගහනය 241,697 කට ආසන්න වේ. දරිද්‍රතාවය ඉහළම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලෙස රිදිමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දැක්විය හැක. එම කොට්ඨාශයේ මුළු ජනගහනයෙන් 51% ක් පමණ දරිද්‍රතාවයෙන් පෙළෙති.

2006-2007 වර්ෂ වල කරන ලද සමීක්ෂණය අනුව මෙම දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය 23.7% දක්වා අඩු වී ඇති නමුත්, මෙරට දරිද්‍රතා මට්ටම වන 15.2% හා සසඳා බලන විට එය ඉතා ඉහළ අගයකි. 2009/2010 සමීක්ෂණයට අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය 13.3 වේ. එනිසා මෙම දිස්ත්‍රික්කයේ දිළිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කරන බොහෝමයක් වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක ලඟා කරගෙන ඇත් ද යන ප්‍රශ්නය මතු කරයි. එනිසා මෙම දිස්ත්‍රික්කයේ දිළිඳුකම පිටුදැකීමට විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය ඒ තුළින් මතු කරයි.


# ප්‍රධාන නිෂ්පාදන

## බදුල්ල දිස්ත්‍රික්කයේ

බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදනය වන්නේ වී වගාවයි. 2010 වර්ෂයේ වී නිෂ්පාදනය මෙ.ටොන්(දහස්) 125,845 ක් පමණ වේ. 2011 වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටොන් 48,036 ක් වන අතර, එම අගය හා සසඳා බලන කළ වී නිෂ්පාදනයේ ප්‍රමාණවත් වර්ධනයක් මෙම කාලය තුළ සිදු වී නැති බව පෙනී යයි.




වී නිෂ්පාදනයට අමතරව තේ, පොල්, හා රබර් වගාවන් මෙන්ම පුවක්, ගම්මිරිස්, එනසල් ඇතුළු අනෙකුත් බෝගයන්ද මෙම දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදනය කරති.




**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කෘෂිකාර්මික බෝග වගාව (හෙක්ටයාර් වලින්)**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තේ | රබර් | පොල් |
|---|---|---|---|
| මහියංගණය | - | - | 1310.8 |
| රිදීමාලියද්ද | - | - | 963.4 |
| මීගහකිවුල | 693 | 20.4 | 133.5 |
| කන්දකැටිය | 1330 | - | 233.0 |
| සොරණාතොට | 691 | 66.8 | 107.5 |
| පස්සර | 3224 | 0.4 | 117.4 |
| ලුණුගල | 3929 | 97.8 | 116.8 |
| බදුල්ල | 819 | - | 106.0 |
| හාලිඇල | 5880 | - | 112.2 |
| ඌවපරණගම | 2483 | - | 107.9 |
| වැලිමඩ | 35.64 | - | 13.0 |
| බණ්ඩාරවෙල | 2505 | - | 10.8 |
| ඇල්ල | 3608 | - | 48.6 |
| හපුතලේ | 2670 | - | 3.8 |
| හල්දුම්මුල්ල | 2646 | 226.7 | 223.3 |
| එකතුව | 34042 | 412.1 | 3608.0 |

# බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථිර හා අර්ධ බෝග වගා කළ බිම් ප්‍රමාණය හා අස්වැන්න


| බෝගය | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | | නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| | ඵලදරන | ඵලනොදරන | ඒකක | ප්‍රමාණය |
| කුරුඳු | 309.22 | 119.09 | කි.ග්‍රෑම් | 261,723 |
| කෝපි | 314.91 | 148.95 | කි.ග්‍රෑම් | 228,064 |
| කොකෝවා | 13.84 | 11.23 | කි.ග්‍රෑම් | 8,771 |
| ගම්මිරිස් | 2,856.24 | 553.46 | කි.ග්‍රෑම් | 2,518,639 |
| කරදමුංගු | 3.00 | 0.40 | කි.ග්‍රෑම් | 1,912 |
| කරාබු | 34.93 | 11.16 | කි.ග්‍රෑම් | 25,024 |
| පුවක් | 1,122.20 | 308.64 | කි.ග්‍රෑම් | 7,658,542 |
| කජු | 539.62 | 259.80 | දහස් ගණන | 99,919 |
| දොඩම් | 384.08 | 196.76 | ගණන | 9,932,757 |
| දෙහි | 502.91 | 204.01 | ගණන | 20,003,812 |
| අඹ | 710.01 | 338.56 | ගණන | 21,871,245 |
| කොස් | 1,524.09 | 462.13 | ගණන | 7,365,639 |
| දෙල් | 167.57 | 52.13 | ගණන | 1,982,345 |
| උක් | 22.20 | 5.60 | කි.ග්‍රෑම් | 875,456 |
| කෙසෙල් | 1,990.86 | 542.91 | කැන් ගණන | 1,620,693 |
| පැපොල් | 213.08 | 101.27 | ගණන | 2,646,375 |
| අන්නාසි | 108.05 | 54.59 | ගණන | 1,245,837 |
| පැෂන් ෆෲට් | 8.51 | 5.30 | ගණන | 165,582 |
| බුලත් | 42.49 | 16.10 | දහස් ගණන | 23,236 |

මූලාශ්‍රය-සංඛ්‍යා ලේඛන අංශය, බදුල්ල


කෘෂිකර්මාන්තය හා බැඳි පවතින ආර්ථික ක්‍රමවේදයක් මෙම දිස්ත්‍රික්කයේ ජනතාව තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වන බැවින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ දිළිඳුකම පිටු දැකීමට වී වගාව, තේ, පොල් හා රබර් වගාවන් මෙන්ම අනෙකුත් බෝග වගාවන් ඉලක්ක ආදායම් ඉපයීමේ ප්‍රවේශයක් කරා යොමු කළ යුතුව ඇත. විශේෂයෙන්ම සාම්ප්‍රදායික වගා ක්‍රම වලින් බැහැරව නූතන තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම රාජ්‍ය අංශය ඔස්සේ ලබාදිය යුතුව ඇත. පෙර සඳහන් කළ පරිදි 2002 වර්ෂයට සාපේක්ෂව 2007 වර්ෂයේ මෙම දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය 37% ක මට්ටමක සිට 22.7% දක්වා අඩු වී තිබුණද, ඒ තුළ යථාර්තය පිලිබිඹු වන්නේ ද යන ප්‍රශ්නය මතුකරයි. එම අඩුවීම තව දුරටත් රඳවා ගැනීමටත්, හැකිතාක් දුරට දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය අඩු කර ගැනීමටත් මෙම දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ආර්ථිකයේ තිරසාර වර්ධනයක් සිදු විය යුතුව ඇත. හුදු සේවා ගලා යාම් තුළින් දරිද්‍රතාවය අඩුවීම සැබෑ යථාර්තය නිරූපණය නොවන්නකි.

ඒ නිසා රජයේ මඟපෙන්වීම මත දිස්ත්‍රික්කයේ දිළිඳු බව අඩු කිරිමට නිෂ්පාදන වර්ධන ආර්ථික ක්‍රමයක් ගොඩ නැංවීමට ක්‍රියා කළ යුතුව ඇත.


# පරිපාලන ව්‍යුහය


බදුල්ල දිස්ත්‍රික්කය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15
ග්‍රාම නිලධාරි කොට්ඨාස 567
ගම් 1996
වතු 186
නගර 3

# බදුල්ල දිස්ත්‍රික්කය



# බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ




බදුල්ල දිස්ත්‍රික් ලේකම් යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි.එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 567 පවතී. එම ග්‍රාම නිලධාරි කොට්ඨාශ 567 හි ගම් 1996 ක්ද, වතු 186 ක්ද, පිහිටා ඇත.

පළාත් පාලන ආසන මට්ටමෙන් ගත් විට ප්‍රාදේශීය සභා 13 ක්, නගර සභා 01 ක් හා මහ නගර සභා 02 ක් පවතී.


## කාර්ය මණ්ඩල විස්තරය හා සංවිධාන සටහන

### අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර.

| තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2013 වර්ෂයේ සත්‍ය සේවක |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | |
| දිස්ත්‍රික් ලේකම් ශ්‍රී.ල.ප.සේ 1 | 1 | 1 |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් ශ්‍රී.ල.ප.සේ 1 | 1 | 1 |
| ප්‍රාදේශීය ලේකම් ශ්‍රී.ල.ප.සේ 1 | 15 | 15 |
| ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී. ල. ග. සේ 1 | 1 | 1 |
| දිස්ත්‍රික් ඉංජිනේරු ශ්‍රී.ල.ඉ.සේ 11/11 | 1 | 1 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් ශ්‍රී.ල.ප.සේ 11/11 | 1 | 1 |
| සහකාර ප්‍රාදේශීය ලේකම් ශ්‍රී.ල.ප.සේ 11/11 | 15 | 12 |
| ගණකාධිකාරී – ශ්‍රී. ල. ග. සේ | 16 | 14 |
| උප එකතුව | 51 | 46 |
| **තෘතිය මට්ටම** | | |
| පරිපාලන නිලධාරී (සා.ලි.සේ අධි පන්තිය) | 16 | 13 |
| ග්‍රාම නිලධාරී (අධි පන්තිය) | 15 | 6 |
| භාෂා පරිවර්තක | 4 | 2 |
| උප එකතුව | **35** | **21** |
| **ද්වීතීයික මට්ටම** | | |
| අයවැය සහකාර | 2 | 2 |
| සංවර්ධන සම්බන්ධීකාරක | 16 | 10 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර(රා.ක.සේ 1,11,111) | 385 | 344 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 17 | 9 |
| කාර්මික නිලධාරී(276 වැටුප් ලබන) | 26 | 19 |
| සැළසුම් ශිල්පී (276 වැටුප් ලබන) | 5 | 0 |
| ග්‍රාම නිලධාරී - 1, 11 | 567 | 392 |
| සංවර්ධන නිලධාරී | | 45 |
| පිළිගැනීමේ නිලධාරී | 1 | 1 |
| උප එකතුව | 1019 | 822 |
| **ප්‍රාථමික මට්ටම** | | |
| රියදුරු -1,11 | 33 | 32 |
| කාර්යාල කාර්යය සහායක(කා.සේ.සේ -1,11) | 75 | 77 |
| මුරකරු | 21 | 04 |
| සනීපාරක්ෂක කම්කරු | 16 | 04 |
| අනියම්/ ආදේශක/ තාවකාලික කම්කරු | | 21 |
| උප එකතුව | 145 | 138 |
| | | |
| එකතුව | **1250** | **1027** |

# සංවිධාන සටහන

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල




15


## වාර්ෂික කාර්යය සාධනය

දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන නමින් එක් වැඩසටහනක් පමණක් පවතී. එම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති තුනකි.


- ❖ සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- ❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- ❖ මහියංගණ බිංතැන්න කොට්ඨාශ

2013 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන මුදල රු.මිලියන 522 කි. මෙම මුදලින් රු.මිලියන 463 පුනරාවර්තන වියදම් සඳහාද රු.මිලියන 70 ක් මූලධන වියදම් සඳහාද වෙන් කර තිබුණි.


පුනරාවර්තන වියදම් සඳහා 2013 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 461 ක් උපයෝජනය කරන ලදී. එය ප්‍රතිපාදන මුදලින් 99.5% කි. ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදලින් 80%ක් උපයෝජනය කිරීමට හැකි වූ අතර, විවධ හේතූන් නිසා 20% ක් ඉතිරි විය.





2012 වර්ෂය හා සසඳා බලන කළ 2013 වර්ෂයේ පුනරාවර්තන වියදම්වල පහළ යාමක් පෙන්නුම් කිරිම දැකිය හැකි විශේෂිත ලක්ෂණයකි. 2012 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රු.මිලියන 467 කි. 2013 වර්ෂයේදි එය රු. මිලියන 463 කි.




“**සාමාන්‍ය පරිපාලන සහ ආයතන සේවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**” යන ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වියදම් සඳහා හා ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දී තිබුණි. ඒ අනුව, 2013 වර්ෂය සඳහා එම වැය ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 38.7 ක ප්‍රතිපාදන මුදල් වෙන් කෙරුණි.එයින් මිලියන 26.4 පුද්ගල පඩිනඩි සඳහා ද මිලියන 12.3 ක් අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා ද විය.එම මුදලින් 99.7 % ක් උපයෝජනය විය.




02 වන ව්‍යාපෘතිය වන “**ප්‍රාදේශීය ලේකම් කාර්යාල**” ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි.බදුල්ල, පස්සර, හාලිඇල, වැලිමඩ, ඌවපරණගම, බණ්ඩාරවෙල, ඇල්ල, හපුතලේ, හල්දුම්මුල්ල සහ ලුණුගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල එයට අයත් වේ. එම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 304.7 ක් 2013 වර්ෂය සඳහා වෙන් වූ අතර, එයින් මිලියන 274.9 ක් පුද්ගල පඩිනඩි සඳහා ද මිලියන 29.8 ක් අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා ද වෙන් කර තිබුණි. මෙම මුදලින් 100% ක් උපයෝජනය කර තිබුණි.





03 වන ව්‍යාපෘතිය වන “**මහියංගණය හා බිංතැන්න කොට්ඨාශය**” යන ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් ඇතුළත් වේ. මහියංගණ, රිදීමාලියද්ද, මීගහකිවුල, කන්දකැටිය, සොරණාතොට යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පුද්ගල පඩිනඩි සඳහා රුපියල් මිලියන 105.5 ක් වෙන් වූ අතර, අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා වෙන් වූ මුදල රු. මිලියන 13.9 කි. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයට රු. මිලියන 119.4 ක මුදලක් වෙන්විය. එම මුදල් ප්‍රතිපාදන වලින් රු. මිලියන 118.3 ක් වැය වී තිබුණි.



# ව්‍යාපෘතිය අනුව මූලධාන වියදම්

2013 වර්ෂය සඳහා මෙම වැය ශීර්ෂය යටතේ වෙන් කළ ප්‍රතිපාදන මුදල රු.මිලියන 69.8 කි. එම ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 56.1 ක් උපයෝජනය කර ඇත.එයින් රු.මිලියන 13 ක් ගොඩනැගිලි අළුත්වැඩියා සඳහාත්, රු.මිලියන 1.3 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහාත්, රු.මිලියන 1.9 ක් වාහන අළුත්වැඩියාව සඳහාත් යොදවා ඇත.මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා 2013 වර්ෂයට දරණ ලද වියදම රු.මිලියන 37.4 කි.එම මුදලින් රු.මිලියන 2.7 ක් උපකරණ මිලදී ගැනීම සඳහා වැය විය.

ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ යොදවා ඇති මුදල රු.මිලියන 29.0 කි. පුහුණු කිරීම් හා හැකියා වර්ධනය සඳහා රු.මිලියන 2.4 කට ආසන්න මුදලක් යොදවන ලදී.





### පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්

බදුල්ල නගරයට පිවිසෙන රථ වාහන ගාල් කිරීම සඳහා භූගත රථ ගාලක් ඉදිකිරීම මෙම වසරේ දී ආරම්භ කරන ලදී. එහි ඉදිකිරීම් මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි.66 කි. 2013 වර්ෂයේ දී ඒ සඳහා රු.මි 25 ක මුදලක් එහි ඉදිකිරීම් කටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලදී.

මීට අමතරව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට නවාතැන් පහසුකම් ලබාදීම සඳහා සාද නිවසක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. 2013 වර්ෂයේදී ඒ සඳහා රු.මි 2.03 ක මුදලක් අත්තිකාරම් ගෙවන ලදී.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ අනාරක්ෂිත කොටසේ තාප්පයක් ඉදිකිරීම 2013 වර්ෂයේ සිදු වූ අතර ඒ සඳහා රු.මි 1.6 ක් වැය වුණි.




ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පවතින උපකරණ හිඟය මගහරවා ගැනීමටත්, සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් අපේක්ෂා කර උපකරණ හිඟ කාර්යාල සඳහා මේස, පුටු, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, රිසෝ යන්ත්‍ර ආදි උපකරණ මිලදී ගැනීම ද සිදු කරන ලදී.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ට අයත් කාර්යාල ගොඩනැගිලි හා නිල නිවාස වල අඩුපාඩු බොහෝමයක් පැවැතියත් 2013 වර්ෂයේ එම ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා මූලධන වැය විෂය යටතේ රු මිලියන 13.1 ක මුදලක් වෙන් විය. එම මුදලින් රු මිලියන 13.0 ක ගොඩනැගිලි අළුත්වැඩියාවන් සිදු කිරීමට 2013 වර්ෂයේ දි හැකිවුණි.

තවද, මෙම කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 හි නිලධාරීන් පුහුණු කිරිම සඳහා රු. 2,500,000.00 ක් 2013 වෙන් කර තිබුණි. එම ප්‍රතිපාදනය යොදවා දිස්ත්‍රික් දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානයේදී නිලධාරීන් විශාල ප්‍රමාණයක් පුහුණු කරන ලදී.

මෙයට අමතරව ඵලදායි රාජ්‍ය සේවයක් ගොඩනැංවීමට අදාළව ආකල්පමය වෙනසක් නිලධාරින් තුළ ඇති කිරීම සඳහා වන පාඨමාලා වලට නිලධාරින් සම්බන්ධ කරන ලදී.

01. “Computer Driving Licences” පාඨමාලාව
02. පරිගණක පුහුණුවට අදාළ මූලික පාඨමාලා
03. පරිගණක ගත ගිණුම්කරණ පාඨමාලා
04. පරිගණක ඩිප්ලෝමා පාඨමාලාව වැනි පුහුණු පාඨමාලා පවත්වන ලදී.



**ඉදිවී ඇති බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල**




**දිස්ත්‍රික් ලේකම් කාර්යාල පැරණි ගොඩනැගිල්ල**

# වියදම් ප්‍රභවය


වාර්ෂික විසර්ජන පනත මඟින් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වෙන් කර දෙනු ලබන ප්‍රතිපාදන දේශීය අරමුදලට සීමාවී ඇත.එනම්, විදේශීය ආධාර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය මඟින් ප්‍රතිපාදන සලස්වා දී නොමැත.

2013 වර්ෂයේ මෙම වැය ශීර්ෂයට ආදාළ ව්‍යාපෘති සඳහා පුනරාවර්තන වියදම් රු මිලියන 461 ක් දරා ඇත.මූලධන වියදම් සඳහා රු.මිලියන 56.1 ක් ද දරා ඇත.මෙම සියළු වියදම් දේශීය අරමුදල මඟින් දරණ ලද වියදම් වේ.

මූලධන වියදම්





පුනරාවර්තන වියදම්



# ආදායම් - 2013 වර්ෂයේ

ආදායම් ගණන් දීමේ නිලධාරීන්ට අයත් විවිධ ආදායම් ශීර්ෂ සඳහා ආදායම් රැස් කිරීමේ කාර්යය මෙම කාර්යාලය හා එයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධාන කාර්යයන් අතරට ගැනේ.2013 වර්ෂයේදී රැස් කරන ලද මුළු ආදායම රු.මිලියන 102.7 කට ආසන්නවේ. එයින් රු.මි. 22 ක මුදල් රජයේ නිලධාරීන්ගේ ණය පොලී හා වැන්දඹු අනත්දරු සඳහා රජයේ නිලධාරීන්ගෙන් අය කරන ගැනීම් වේ. එම ආදායම් හැර රැස්කරනු ලබන ආදායම රු.මිලියන 80.7 ක් පමණ වේ.




**ඒ ඒ ආදායම් ශීර්ෂ යටතේ එකතු කරන ලද ආදායම් විස්තර පහතින් දැක්වේ.**

| **ආදායම් ශීර්ෂය** | **විස්තරය** | එකතුව මුළු ආදායම(රු) |
|---|---|---|
| 1003-07-02 | රෙජි.ජ.දෙපාර්.අදාළ ලියාපදිංචි ගාස්තු | 23,343,295 |
| 1003-07-03 | පෞ.දැව ප්‍රවාහනය | 868,870 |
| 1003-07-05 | මහජන ආ.නිතිය හා සාමය පිළිබඳ අමා.අදාළ බල ගාස්තු | 206,477 |
| 1003-07-99 | අනෙකුත් බලපත්‍ර | 3,273,387 |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි කුලී | 1,778,248 |
| 2002-01-02 | රජයේ කැලෑ වලින් ලද ආදායම් | 249,753 |
| 2002-02-99 | වෙනත් | 7,944,806 |
| 2003-01-00 | දෙපාර.විකුණුම් | 4,541,695 |
| 2003-02-07 | වීසා හා ගමන් බල ගාස්තු | 644,000 |
| 2003-02-13 | විභාග ගාස්තු | 986,950 |
| 2003-02-14 | මො.රථ ප්‍ර.පනත යටතේ ගා. | 27,069,500 |
| 2003-02-99 | විවිධ | 9,735,009 |
| 2003-03-00 | දඩ මුදල් හා රාජ්‍ය සන්තක කිරීම | 90,968 |
| 2004-01-00 | මධ්‍යම රජය | 21,974,508 |
| එකතුව | | **102,701,625** |

# තැන්පත් ගිණුම බදුල්ල දිස්ත්‍රික් ලේකම්

6003/0/0/52/0 වන බදුල්ල දිස්ත්‍රික් ලේකම් නව තැන්පත් ගිණුම යටතේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ අනෙකුත් කාර්යාල වලින් ලැබෙන ලැබීම් හා ගෙවීම් පවත්වාගෙන යනු ලබයි. විශේෂයෙන්ම එම කාර්යාල වල කටයුතු ප්‍රාදේශීය මට්ටමින් ඉටුකර ගැනීමට අවශ්‍ය වූ විට මෙම තැම්පත් ගිණුම යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් අවශ්‍ය මූල්‍ය කටයුතු පවත්වාගෙන යනු ලබයි. එකී කාර්යයන් ඉටුකර ගැනීමට මෙම කාර්යාලය තම සහය දක්වනු ලැබේ.ඒ තුළින් රජයේ කාර්යාල අතර අන්තර සම්බන්ධතාවය වර්ධනය කර ගනිමින් වඩාත් විධිමත් රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට හැකිවේ.

**2013 වර්ෂයේ තැම්පත් ගිණුමට අදාළ ලැබීම් හා ගෙවීම් සාරාංශ**
**ගිණුම් අංක - 6003/0/0/52/0**

| *2013.01.01 දිනට ආරම්භක බැර ශේෂය* | *2013 වර්ෂය තුළ මුළු හර* | *2013 වර්ෂය තුළ මුළු බැර* | *වර්ෂයේ අවසානයට ශේෂය* |
|---|---|---|---|
| 442,362,249.00 | 490,732,882.00 | 555,743,177.00 | 507,372,544.00 |

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම


බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක සේවය කරන නිලධාරීන් සඳහා රජය මඟින් ලබා දෙන ණය ගෙවීම් හා ලැබීම් පාලනය දිස්ත්‍රික් ලේකම් අත්තිකාරම් බී ගිණුම වන 27601 යටතේ සිදු කරයි.ණය ගෙවීම් හා ලැබීම් ගිණුම් ගත කිරීම සඳහා 276011 වශයෙන් ගිණුමක් හා වැය ශීර්ෂ අතර ණය නිරවුල් කර ගැනීම සඳහා 276012 වශයෙන් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබේ.

රජයේ නිලධාරීන් සඳහා රජය මඟින් ගෙවනු ලබන ණය වර්ග අතර ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ප්‍රධාන වේ.

### 2013 අත්තිකාරම් බී ගිණුම

| විස්තරය | මුදල |
|---|---|
| වර්ෂය තුළ ණය ගෙවීමට ලැබුණු මුළු මුදල | 43,100,000 |
| වර්ෂය තුළ ගෙවන ලද මුළු ණය මුදල | 34,224,875 |
| වර්ෂය තුළ අයකර ගන්නා ලද මුළු ණය මුදල | 32,181,557 |
| තවදුරටත් අයකර ගැනීමට පවතින මුළු ණය මුදල | 122,530,366 |

### 2013 වර්ෂය




# අග්‍රිම විස්තරය
## 2013 වර්ෂය

මෙම කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල මැදිහත් වීම මත 2013 වර්ෂයේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්, සුභසාධන වැඩසටහන් ඇතුළු විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මුල්‍ය සම්බන්ධීකරණය සිදු කිරීමට අවශ්‍ය අග්‍රිම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පාලනය මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දෙන ලදී.

2013 වර්ෂයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු- මිලියන 3,352 ක අක්මුදල් ලබා දී ඇත. එයට අමතරව අප කාර්යාල වලින් රැස්කර ගන්නා ලද මුදල රු මිලියන 509 කි.එම අග්‍රිම මුදල , එනම් මිලියන 3,861 ක මුදලක් 2013 වර්ෂයේ වියදම් කර තිබුණි.

| මාසය | භාණ්ඩාගාරයෙන් ලැබුණු අක්මුදල් රු.මි | වෙනත් ලැබීම් (මුදලින්) රු. මි | මුළු ලැබීම් රු. මි | මුළු ගෙවීම් රු. මි |
|---|---|---|---|---|
| ජනවාරි | 402 | 15 | 417 | 344 |
| පෙබරවාරි | 263 | 10 | 273 | 282 |
| මාර්තු | 335 | 34 | 370 | 285 |
| අප්‍රේල් | 388 | 96 | 484 | 449 |
| මැයි | 352 | 11 | 363 | 248 |
| ජූනි | 222 | 11 | 233 | 280 |
| ජූලි | 179 | 11 | 190 | 270 |
| අගෝස්තු | 240 | 70 | 310 | 312 |
| සැප්තැම්බර් | 253 | 138 | 391 | 271 |
| ඔක්තෝබර් | 327 | 78 | 405 | 403 |
| නොවැම්බර් | 178 | 12 | 189 | 282 |
| දෙසැම්බර් | 214 | 23 | 237 | 436 |
| එකතුව | 3352 | 509 | 3861 | 3861 |


## අග්‍රිම ලැබීම් හා ගෙවීම් - 2013 වර්ෂය




# වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව 2013 වර්ෂයේ ඉටුකළ කාර්යයන්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ප්‍රාදේශීය කාර්යයන් බොහෝමයක් සම්බන්ධීකරණය කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි. ඒ සඳහා අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරන අතරම, මූල්‍ය කළමනාකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉටු කරයි.

2013 වර්ෂයේ දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 41 ක් යටතේ ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි.එම ප්‍රතිපාදන වලින් විවිධ කටයුතු කරන ලදී. ඒ අතරින්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගම නැගුම වැඩසටහන, දිවි නැගුම හා පුබුදමු වෙල්ලස්ස වැඩසටහන් සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රධාන වේ.




මුදල රු මිලියන




## පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම


බදුල්ල දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් ග්‍රාමීය සමාජ, ආර්ථික සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2013 වර්ෂයේදී ද පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සම්බන්ධීකරණය වු අතර, ඌව පළාත් මාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

එම ව්‍යාපෘතිය යටතේ මාර්ග කිලෝ මීටර් 277 කාපට් කිරීම බදුල්ල දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.මි 5848 කි. 2013 වර්ෂයේ ඒ සඳහා දරණ ලද මුළු වියදම රු. මිලියන 1,108 ක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේ රු.මි. 1174.6 ක් ද 2012 වර්ෂයේ රු.මි. 1816.1 ක් ද දරා ඇත.

## විමධ්‍යගත අයවැය වැඩසටහන - 2013 වර්ෂය

පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් වෙත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රාදේශීය සංවර්ධන සඳහා වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන තුළින් වාර්ෂිකව ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරයි. 2013 වර්ෂයේ දී බදුල්ල දිස්ත්‍රික්කය එම වැඩසටහන යටතේ ව්‍යාපෘති 716 ක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම රු මිලියන 42.3 ක් පමණ වේ.

### විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති



## විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වියදම් 2013-වර්ෂය

| | ව්‍යාපෘති ගණන | වියදම රු. මිලියන |
|---|---|---|
| ➢ මහියංගණ | 58 | 3.37 |
| ➢ රිදීමාලියද්ද | 57 | 3.72 |
| ➢ මීගහකිවුල | 26 | 1.52 |
| ➢ කන්දකැටිය | 23 | 1.34 |
| ➢ සොරණාතොට | 27 | 1.36 |
| ➢ බදුල්ල | 84 | 4.14 |
| ➢ පස්සර | 25 | 1.59 |
| ➢ හාලිඇල | 88 | 4.39 |
| ➢ වැලිමඩ | 54 | 3.33 |
| ➢ ඌවපරණගම | 60 | 3.76 |
| ➢ බණ්ඩාරවෙල | 50 | 3.95 |
| ➢ ඇල්ල | 35 | 2.32 |
| ➢ හපුතලේ | 48 | 1.97 |
| ➢ හල්දුම්මුල්ල | 56 | 2.52 |
| ➢ ලුණුගල | 19 | 1.25 |
| ➢ දි.ලේ.කාර්යාලය | 7 | 0.46 |
| ➢ පරිපාලන වියදම් | | 1.22 |
| එකතුව | | **42. 28** |

## දිවි නැගුම වැඩසටහන - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### පැල බෙදාදීම - 2012 වර්ෂය

| අනු අංකය | පැල වර්ගය | ලබාදුන් පැල ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| 1 | පළතුරු | 197,310 | 20,887,103 |
| 2 | පොල් | 161,718 | 2,383,250 |
| 3 | අපනයන භෝග | 49,920 | 966,228 |
| 4 | ඖෂධ | 36,669 | 1,682,635 |
| 5 | කජු | 23,699 | 5,549,800 |
| 6 | වනවගා | 14,328 | 1,336,970 |
| 7 | එළවළු | 35,880 | 56,395 |
| 8 | මිරිස් මුරුංගා | 10,000 | 585,600 |
| 9 | කුරක්කන් | 41 | 4,715 |
| | එකතුව | 529,565 | 33,452,696 |

| සත්ව පාලනය | | | |
|---|---|---|---|
| අනු අංකය | වර්ගය | ලබාදුන් ප්‍රමාණය | වියදම |
| 1 | මීමැසි පෙට්ටි | 576 | 612,351 |
| 2 | මීමැසි පෙට්ටි - පුහුණු | 7 | 48,911 |
| 3 | කුකුල් පැටව් | 18,130 | 6,890,650 |
| 4 | කුකුල් කූඩු | 2,590 | 10,415,091 |
| | එකතුව | 21,303 | 17,967,003 |

| කර්මාන්ත | | | |
|---|---|---|---|
| අනු අංකය | වර්ගය | ලබාදුන් ප්‍රමාණය | වියදම |
| 1 | ගෘහස්ථ කර්මාන්ත- පුහුණු | 576 | 612,351 |
| 2 | කර්මාන්ත ප්‍රදර්ශනය | 7 | 48,911 |
| 3 | ස්වයං රැකියා හා කර්මාන්ත උපකරණ | 18,130 | 6,890,650 |
| | එකතුව | 18,713 | 7,551,912 |

# සමෘද්ධි වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය ජනතාවගේ සමාජීය, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ අභිලාශයෙන් ක්‍රියාත්මක සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ 2013 වර්ෂයේ දී සමෘද්ධි අධිකාරිය යටතේ දරණ ලද මුළු වියදම රු-මිලියන 428 ක් පමණ වන අතර, සමෘද්ධි කොමසාරිස් ජනරාල් වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සඳහා දරණ ලද මුළු වියදම රු-මිලියන 667 ක් පමණ වේ. ඒ අනුව සමෘද්ධි වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ කටයුතු වෙනුවෙන් දරණ ලද මුළු වියදම ආසන්න වශයෙන් රු.මිලියන 1095 ක් පමණ වේ.

සමෘද්ධි අධිකාරිය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ සමෘද්ධි ග්‍රාම නිලධාරි වසම් සංවර්ධනය කිරීමේ වැඩසටහන ප්‍රධාන වේ.බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 567 ක් සංවර්ධනය ඒ යටතේ සිදු විය.එහිදී,

1. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. දිරිය පියස නිවාස සංවර්ධන වැඩසටහන හා සදාචාරත්මක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු විය.

එහිදී තොරාගත් වසම් 567 හි ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ඒ යටතේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

## දිවි නැගුම වැඩසටහනට සමගාමීව 2012 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සමෘද්ධි ව්‍යාපෘති

### 1.ජීවනෝපාය ව්‍යාපෘති - 2012

| වැඩසටහන | අංශය | ව්‍යාපෘතිය | ඉලක්ක ව්‍යාපෘති සංඛ්‍යාව | අපේක්ෂිත මුදල රු.මි. | වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කළ මුදල රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| දිවිනැගුම " ජාතික වැඩසටහනට සමගාමීව සමෘද්ධි ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | කෘෂි ව්‍යාපෘති | ආරක්ෂිත දැල් ගෘහ (රු.80000 බැගින්) | 400 | 32.00 | 15.76 | 197 | 15.69 |
| | | විසිතුරු මල් වගාව (රු.25000 බැගින්) | 90 | 3.60 | 1.88 | 75 | 1.75 |
| | | මීමැසි පාලනය (රු.2000 බැගින්) | 450 | 0.90 | 0.46 | 230 | 0.45 |
| | | බිම් මල් වගාව (රු.10000 බැගින්) | 500 | 5.00 | 1.96 | 196 | 2.02 |
| | සත්ත්ව පාලන ව්‍යාපෘති | ගවගාල් ඉදිකිරීම (රු.35000 බැගින්) | 1000 | 25.00 | 8.47 | 242 | 8.36 |
| | | එළු පාලනය (රු.15000 බැගින්) | 50 | 0.75 | 0.45 | 30 | 0.00 |
| | | විසිතුරු මසුන් ඇතිකිරීම (රු.36000 බැගින්) | 25 | 0.90 | 0.00 | 0 | 0.00 |
| | කර්මාන්ත ව්‍යාපෘති | කිතුල් ගස් මැදීම (රු.5000 බැගින්) | 500 | 2.50 | 1.32 | 271 | 1.27 |
| | | කිතුල් ආශ්‍රිත ක්ෂුද්‍ර කර්මාන්ත (රු.30000 බැගින්) | 100 | 3.00 | 1.38 | 42 | 1.24 |
| උප එකතුව | | | **3115** | **73.65** | **31.68** | **1283** | **30.78** |

### "දිවිනැගුම" ජාතික වැඩසටහන තෙවන අදියර - 2012

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිළධාරි වසම් ගණන | රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම | |
|---|---|---|---|
| | | බීජ කට්ටල සංඛ්‍යාව - 3 වන අදියර | බීජ කට්ටල සංඛ්‍යාව - 4 වන අදියර |
| මහියංගණය | 35 | 5250 | 22552 |
| රිදීමාලියද්ද | 42 | 6300 | 14696 |
| කන්දකැටිය | 26 | 3900 | 7092 |
| මීගහකිවුල | 20 | 3000 | 6089 |
| සොරණාතොට | 25 | 3750 | 6909 |
| බදුල්ල | 29 | 4350 | 21350 |
| පස්සර | 41 | 8550 | 13817 |
| ලුණුගල | 28 | 4800 | 8032 |
| හාලිඇල | 57 | 5250 | 26934 |

| | | | |
|---|---|---|---|
| ඇල්ල | 32 | 3900 | 13800 |
| බණ්ඩාරවෙල | 35 | 5850 | 15942 |
| හපුතලේ | 26 | 9600 | 13014 |
| හල්දුම්මුල්ල | 39 | 10200 | 12337 |
| වැලිමඩ | 64 | 4200 | 27202 |
| ඌවපරණගම | 68 | 6150 | 22650 |
| එකතුව | 567 | 85050 | 232416 |

**යටිතල පහසුකම් ව්‍යාපෘති - 2012**

| වැඩසටහන | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කළ මුදල රු.මි. |
|---|---|---|---|---|---|
| ජීවනෝපාය ව්‍යාපෘති සඳහා සෘජුවම ඉවහල්වන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (සොරණාතොට, බණ්ඩාරවෙල) | කොස්ගොල්ල හැවන්කුඹුර ඇල කොන්ක්‍රීට් කිරීම | 16 | 499,857.81 | 1 | 62876.84 |
| | බඹරගම-පෙරමස්අරාව ඇල හා අමුණ ඉදිකිරීම | 40 | 499,150.00 | 1 | 492910.62 |
| **උප එකතුව** | | **56** | **7.44** | **2** | **555787.46** |

**නිවාස වැඩසටහන - 2012**

| වැඩසටහන | නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | ලද මුදල රු.මි. | ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| දිරිය පියස නිවාස - (කොට්ඨාශයට වෙන් කළ ප්‍රතිපාදන අනුව) | 44 | 2.00 | 2.00 | 44 | 32 |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල -2010 ජයග්‍රාහී චෙක්පත් නිකුත් කිරීම | 29 | 4.35 | 4.35 | 29 | 29 |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල - 2011 ජයග්‍රාහී චෙක්පත් නිකුත් කිරීම | 47 | 7.05 | 7.05 | 41 | |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල - 2007,2008,2009 සහ 2010 වසරවල විවිධ හේතූන් නිසා නොගෙවූ ත්‍යාග මුදල් නිදහස් කිරීම | 17 | 2.55 | 2.55 | 17 | |

## අනිකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් 2013 වර්ෂයේ ලැබුණු

## ප්‍රතිපාදන, වියදම් හා ඉතිරිය

| අංකය | වැය ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ලේකම් කාර්යාලය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2013 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු ප්‍රතිපාදන (රු) | 2013 දෙසැම්බර් 31 දිනට සත්‍ය වියදම් (රු) | 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිය / අතිරික්තය (රු) |
|---|---|---|---|---|---|
| 1 | 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 2,081,422.00 | 1,691,305.00 | 390,117.00 |
| 2 | 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 29,000.00 | 28,714.00 | 286 |
| 3 | 103 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 206,647.00 | 205,389.50 | 1,257.50 |
| 4 | 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 1,569,838,097.51 | 1,441,221,782.05 | 128,616,315.46 |
| 5 | 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 16,813,852.70 | 15,458,428.36 | 1,355,424.34 |
| 6 | 110 | අධිකරණ අමාත්‍යාංශය | 7,670,725.00 | 7,440,823.00 | 229,902.00 |
| 7 | 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 7,476,804.95 | 5,379,385.88 | 2,097,419.07 |
| 8 | 120 | ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය | 29,534,003.18 | 28,378,166.58 | 1,155,836.60 |
| 9 | 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 9,910,706.70 | 9,522,587.03 | 388,119.67 |
| 10 | 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 124,861,963.20 | 121,426,004.14 | 3,435,959.06 |
| 11 | 128 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 45,000.00 | 44,530.45 | 469.55 |
| 12 | 130 | පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය | 969,100.00 | 852,697.04 | 116,402.96 |
| 13 | 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 3,966,395.59 | 3,302,118.82 | 664,276.77 |
| 14 | 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 748,578.64 | 679,060.90 | 69,517.74 |
| 15 | 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,994,004.00 | 1,639,167.88 | 354,836.12 |
| 16 | 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 8,379,056.88 | 8,359,605.82 | 19,451.06 |
| 17 | 156 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 2,173,150.00 | 2,159,422.95 | 13,727.05 |
| 18 | 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 75,000.00 | 48,448.00 | 26,552.00 |
| 19 | 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 3,465,667.74 | 3,461,458.78 | 4,208.96 |
| 20 | 179 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 525,000.00 | 175,147.40 | 349,852.60 |
| 21 | 181 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 3,276,500.00 | 3,224,397.35 | 52,102.65 |
| 22 | 182 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය | 3,095,786.00 | 3,093,195.01 | 2,590.99 |
| 23 | 183 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | 3,613,210.65 | 3,500,722.88 | 112,487.77 |
| 24 | 201 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 4,230,705.00 | 3,886,724.57 | 343,980.43 |
| 25 | 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 422,000.00 | 381,688.25 | 40,311.75 |
| 26 | 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000.00 | 7,950.00 | 50 |
| 27 | 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 5,976,538.88 | 5,939,180.46 | 37,358.42 |
| 28 | 217 | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 9,161,250.00 | 9,009,778.58 | 151,471.42 |
| 29 | 218 | සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව | 668,653,963.00 | 667,414,489.22 | 1,239,473.78 |
| 30 | 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,595,000.00 | 1,099,093.15 | 495,906.85 |
| 31 | 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 13,080.00 | 11,370.00 | 1,710.00 |
| 32 | 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2,630,962.00 | 2,630,897.64 | 64.36 |
| 33 | 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 7,686,014.84 | 7,213,242.68 | 472,772.16 |
| 34 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 780,500,000.00 | 775,077,647.79 | 5,422,352.21 |
| 35 | 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2,152,028.26 | 1,938,098.76 | 213,929.50 |
| 36 | 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 5,725,250.00 | 106,346.62 | 5,618,903.38 |
| 37 | 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 5,874,099.84 | 5,538,045.69 | 336,054.15 |
| 38 | 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 88,700.00 | 67,784.00 | 20,916.00 |
| 39 | 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 871,042.35 | 871,042.35 | - |
| 40 | 307 | මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව | 432,500.00 | 368,096.39 | 64,403.61 |
| 41 | 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 5,718,688.00 | 5,689,259.58 | 29,428.42 |
| 42 | 328 | මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | 1,400,044.55 | 1,306,336.64 | 93,707.91 |
| | | එකතුව | **3,303,889,538.46** | **3,149,849,631.19** | **154,039,907.27** |

## එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අදාළව ඉටුකළ කාර්යයන් අතර ප්‍රධාන කාර්යයන්

- ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- සි.බී.ආර් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් අත්පත් කිරීමේ කටයුතු
- උපත්/මරණ/විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු
- ඉඩම් සම්බන්ධ අනෙකුත් කටයුතු
- වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම ඇතුළු ඊට සම්බන්ධ කටයුතු
- ආබාධිත පුද්ගලයින් සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සමාජ සේවා කටයුතු
- ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය වැඩසටහන්
- ළමා හා කාන්තා සංවර්ධන වැඩසටහන්
- ජාතික ආරක්ෂක වැඩසටහන්
- කෘෂිකර්ම වැඩසටහන්
- පරිසර සංරක්ෂණ වැඩසටහන්

ඇතුළු වැඩසටහන් රාශියක් අප කාර්යාල විසින් ඉටු කරන ලදී.
මෙයට අමතරව පළාත් සභා ව්‍යාපෘති රාශියක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත් වීමෙන් සිදු කරන ලදී.

- ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති
- විදුලි/ ජල ව්‍යාපෘති
- ගොඩනැගිලි ඉදිකිරීම්
- වෙනත් සමාජ සේවා ව්‍යාපෘති

## යහපත් මහජන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

- පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම.
- බාහිර ආයතනික සම්බන්ධතා විධිමත් කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනයේදී ජනතා සහභාගීත්වය තුළින් සංවර්ධනය සැලසුම් කිරීම.
- සේවා ලාභියාගේ අවශ්‍යතා පදනම් කරගෙන නියමිත කාලයක් තුළ ගැටළු විසදීමට කටයුතු කිරීම.
- කාර්යාල පද්ධතිය සේවා ලාභීන්ට පහසු වන පරිදි සැකසීම.
- කාර්යාල අලංකාර කිරීම.
- සේවක සුභසාධක වර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීම
- සේවකයන් පුහුණු කිරීම.
- ආකල්ප වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පංචවිධ සංකල්ප ක්‍රියාත්මක කිරීම.
- ඵලදායිතා කව පිහිටුවීම හා ඒ තුළින් ඵලදායිතාව වැඩිකිරීම.

# විසර්ජන ගිණුම 2013

**වියදම් ශීර්ෂ අංකය: 276** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.**

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | ඝලු අංකය (අදාළ ඩී.ජී.එස්. ජී. 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | <u>පුනරාවර්තන</u> | | | | | | | |
| 01 | මෙහෙයුම් වැඩසටහන | 396,635,000 | 66,328,919 | 0 | 462,963,919 | 461,171,942 | 1,791,977 | |
| | උප එකතුව(පුනරාවර්තන) | 396,635,000 | 66,328,919 | 0 | 462,963,919 | 461,171,942 | 1,791,977 | |
| | <u>මූලධාන</u> | | | | | | | |
| 01 | මෙහෙයුම් වැඩසටහන | 69,850,000 | 0 | 0 | 69,850,000 | 56,102,273 | 13,747,727 | |
| | උප එකතුව (මූලධාන) | 69,850,000 | 0 | 0 | 69,850,000 | 56,102,273 | 13,747,727 | |
| 01 | පුනරාවර්තන එකතුව | 396,635,000 | 66,328,919 | 0 | 462,963,919 | 461,171,942 | 1,791,977 | 02 |
| 01 | මූලධාන එකතුව | 69,850,000 | 0 | 0 | 69,850,000 | 56,102,273 | 13,747,727 | 02 |
| - | මුළු එකතුව | 466,485,000 | 66,328,919 | 0 | 532,813,919 | 517,274,215 | 15,539,704 | |
| | | | | | | | | |

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම 2013

**වියදම් ශීර්ෂ අංකය**
**: 276** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.**
**වැඩසටහන් අංකය**
**හා නාමය:** 01- මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධාන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ. ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | සටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ. 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ 3) | 396,635,000 | 66,328,919 | 0 | 462,963,919 | 461,171,942 | 1,791,977 | 03 |
| (ආ) මූලධාන (ඩී.ජී.එස්.ඒ 4) | 69,850,000 | 0 | 0 | 69,850,000 | 56,102,273 | 13,747,727 | 04/05/06 |
| එකතුව | 466,485,000 | 66,328,919 | 0 | 532,813,919 | 517,274,215 | 15,539,704 | |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 276 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල

වැඩසටහන් අංකය හා නාමය: 01 - මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය/ නම, පෞද්ගලික පඩි නඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනිකුත් අය කිරීම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01- සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 20,750,000 | 5,000,000 | 735,285 | 26,485,285 | 26,459,499 | 25,786 |
| අනෙකුත් වියදම් | 9,235,000 | 2,150,000 | 911,000 | 12,296,000 | 12,219,343 | 76,657 |
| උප එකතුව | 29,985,000 | 7,150,000 | 1,646,285 | 38,781,285 | 38,678,842 | 102,443 |
| **02- ප්‍රාදේශීය ලේකම් කාර්යාල** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 228,000,000 | 46,328,919 | 586,715 | 274,915,634 | 274,906,158 | 9,476 |
| අනෙකුත් වියදම් | 27,150,000 | 2,650,000 | 8,000 | 29,808,000 | 29,286,700 | 521,300 |
| උප එකතුව | 255,150,000 | 48,978,919 | 594,715 | 304,723,634 | 304,192,858 | 530,776 |
| **03- මහියංගණ හා බිංතැන්න කොට්ඨාශය** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 96,500,000 | 10,000,000 | -981,000 | 105,519,000 | 104,466,965 | 1,052,035 |
| අනෙකුත් වියදම් | 15,000,000 | 200,000 | -1,260,000 | 13,940,000 | 13,833,277 | 106,723 |
| උප එකතුව | 111,500,000 | 10,200,000 | -2,241,000 | 119,459,000 | 118,300,242 | 1,158,758 |
| මුළු එකතුව | 396,635,000 | 66,328,919 | 0 | 462,963,919 | 461,171,942 | 1,791,977 |

# ව්‍යාපෘති අනුව මූලධාන වියදම්

**වියදම් ශීර්ෂ අංකය : 276** — **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.**

**වැඩසටහන් අංකය හා නාමය:** 01-මෙහෙයුම් වැඩසටහන

**ව්‍යාපෘති අංකය හා නාමය :** 01- සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | අයිතම අංකය | මූල්‍යාකරණ (සංකේත අංකය) | අයිතම විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | ***මූලධාන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම*** | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **12,000,000** | **1,100,000** | **13,100,000** | **13,004,611** | **95,389** |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **850,000** | **900,000** | **1,750,000** | **1,314,756** | **435,244** |
| 2003 | | 11 | වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **2,000,000** | **-** | **2,000,000** | **1,968,358** | **31,642** |
| | | | **උප එකතුව** | **14,850,000** | **2,000,000** | **16,850,000** | **16,287,725** | **562,275** |
| | | | ***මූලධාන වත්කම් අත්පත් කර ගැනීම*** | | | | | - |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | **1,000,000** | **1,800,000** | **2,800,000** | **2,792,492** | **7,508** |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | **2,500,000** | **3,200,000** | **5,700,000** | **5,595,565** | **104,435** |
| 2104 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම | **49,000,000** | **(7000000.00)** | **42,000,000** | **29,020,028** | **12,979,972** |
| *2104* | *5* | *11* | *හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීම* | ***7,000,000*** | ***(7000000.00)*** | ***-*** | ***-*** | ***-*** |
| *2104* | *6* | *11* | *බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල - නිල නිවස සංකීර්ණය ඉදිකිරිම* | ***12,000,000*** | ***(3000000.00)*** | ***9,000,000*** | ***-*** | ***9,000,000*** |
| *2104* | *8* | *11* | *ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල සාද නිවස ඉදිකිරිම* | ***6,000,000*** | ***-*** | ***6,000,000*** | ***2,037,013*** | ***3,962,987*** |
| *2104* | *9* | *11* | *වෙනත් ඉදිකිරිම* | ***4,000,000*** | ***(2000000.00)*** | ***2,000,000*** | ***1,983,015*** | ***16,985*** |
| *2104* | *10* | *11* | *බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගණකාධිකාරි නිල නිවස ඉදිකිරි* | ***2,000,000*** | ***(2000000.00)*** | ***-*** | ***-*** | ***-*** |
| *2104* | *11* | *11* | *බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සාද නිවස ඉදිකිරිම* | ***3,000,000*** | ***(3000000.00)*** | ***-*** | ***-*** | ***-*** |
| *2104* | *12* | *11* | *භූගත රථ ගාල ඉදිකිරිම* | ***15,000,000*** | ***10,000,000*** | ***25,000,000*** | ***25,000,000*** | ***-*** |
| | | | **උප එකතුව** | **52,500,000** | **(2,000,000)** | **50,500,000** | **37,408,085** | **13,091,915** |
| | | | ***හැකියා වර්ධනය*** | | | | | |
| 2401 | *1* | 11 | පුහුණු කිරීම් හා හැකියා වර්ධන | **2,500,000** | **-** | **2,500,000** | **2,406,463** | **93,537** |
| | | | **උප එකතුව** | **2,500,000** | **-** | **2,500,000** | **2,406,463** | **93,537** |
| | | | **එකතුව** | **69,850,000** | **-** | **69,850,000** | **56,102,273** | **13,747,727** |

ඩී.පී.එස්.ඒ. - 5

# වැඩසටහන් අනුව වියදම් මූලායකරණ සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 276

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.

වැඩසටහන් අංකය හා නාමය:: 01-මෙහෙයුම් වැඩසටහන

| අදාළවන නීතිය | සංකේතය | සංකේත විස්තරය | වැඩසටහන 1 | | මුලු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදම් ප්‍රතිශතය |
| | | | 1 | 2 | 3 | 4 | 4/3*100 |
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| විසර්ජන පනත | 11 | දේශීය අරමුදල් | 532,813,919 | 517,274,215 | 532,813,919 | 517,274,215 | 97 |
| | 12 | විදේශ ණය | | | | | |
| | 13 | විදේශ ප්‍රදාන | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ණය | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ප්‍රදාන | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවිය අරමුදල් | | | | | |
| | 17 | විදේශාධාර මූලායයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | |
| | | | | | | | |
| විශේෂ නීති | 21 | විශේෂ නීති සේවා | | | | | |
| | | | | | | | |
| | | **එකතුව** | 532,813,919 | 517,274,215 | 532,813,919 | 517,274,215 | 97 |

ඩී.ජී.එස්.ඒ. - 5 (i)

# එක් එක් වැඩසටහනක ව්‍යාපෘති අනුව වියදම් මූලාසකරණය

**වියදම් ශීර්ෂ අංකය : 27( අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.**

**වැඩසටහන් අංකය හා නාමය: 01-මෙහෙයුම් වැඩසටහන**

| අදාළවන නීතිය | විෂය | ප්‍රභවය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | වැඩසටහනේ එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **විසර්ජන පනත** | 11 | දේශීය අරමුදල් | 108,631,285 | 94,781,115 | 304,723,634 | 304,192,858 | 119,459,000 | 118,300,242 | 532,813,919 | 517,274,215 |
| | 12 | විදේශ ණය | | | | | | | | |
| | 13 | විශේෂ ප්‍රදාන | | | | | | | | |
| | 14 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ණය | | | | | | | | |
| | 15 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ප්‍රදාන | | | | | | | | |
| | 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| | 17 | විදේශාධාර මූලායන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | | | | |
| | | | | | | | | | | |
| **විශේෂ නීතී** | 21 | විශේෂ නීති සේවා | | | | | | | | |
| | | | | | | | | | | |
| | | **එකතුව** | 108,631,285 | 94,781,115 | 304,723,634 | 304,192,858 | 119,459,000 | 118,300,242 | 532,813,919 | 517,274,215 |